Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

## වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *තනතුරු නාමය* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෘත්තීය වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| වැඩ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික ශිල්පීය නොවන | III | 06 | රා.ප.ච 03/2016-PL1-2016 රු.24250-10x250-10x270-10x300-12x330-රු.36,410 | • 8 ශ්‍රේණිය (9වසර) සමත් වී තිබීම. |

03. *පොදු සුදුසුකම් හා කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

(ii) තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45 ත් අතර විය යුතුය. (දැනටමත් වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම සේවා සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව ඉදිරිපත් කළ යුතුය)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවය කරන අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික/ගිවිසුම්ගත පදනමින් සේවය කරන සේවකයින් සඳහා ද, ස්ථිර සේවයේ නියුතු අය සඳහාද, වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලටද, මුදල් රෙගුලාසිවලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

06. අයදුම්පත් එවිය යුතු පිළිවෙල ඃ

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2019.06.29 දිනට හෝ ඊට පෙර ''ලේකම්, උඩුබද්දාව ප්‍රාදේශීය සභාව, උඩුබද්දාව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය;

02. අධ්‍යාපන සහතික;

03. පාසලෙන් අස්වීමේ සහතිකය;

04. පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුයි);

05. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;

06. පොලිස් සහතිකය;

07. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

කේ. කේ. යූ. ජේ. එන්. පෙරේරා,
ලේකම්,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව,
උඩුබද්දාව.

2019 ජූනි මස 06 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**උඩුබද්දව ප්‍රාදේශීය සභාවේ . . . . . . . . . තනතුර සඳහා වූ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :————————————
   මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————
2. පෞද්ගලික ලිපිනය :————————————
3. උපන් දිනය
   අවුරුද්ද :———— මාසය :———— දිනය :————

   (අ) 2019 දිනට වයස: අවු. :———— මාස :———— දින :————

4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————
5. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද, ලියාපදිංචියෙන් ද, යන වග:————————————
6. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————
7. විවාහක/අවිවාහක බව:————————————
8. අධ්‍යාපන සුදුසුකම් :
   අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (ප්‍රථම/දෙවන)

විභාග අංකය:—————— වර්ෂය:—————— මාසය:——————

| සමත් වූ විෂය | ශ්‍රේණිය |
|---|---|
| i. ........................................................ | ................................ |
| ii.. ....................................................... | ................................ |
| iii.. ....................................................... | ................................ |
| iv.. ....................................................... | ................................ |
| v ......................................................... | ................................ |
| vi.. ....................................................... | ................................ |
| vii.. ....................................................... | ................................ |
| viii.. ....................................................... | ................................ |
| ix.. ....................................................... | ................................ |
| x. ....................................................... | ................................ |

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ඃ

විභාග අංකය:—————— වර්ෂය:—————— මාසය :——————

| සමත් වූ විෂය | ශ්‍රේණිය |
|---|---|
| i. ....................................................... | ................................ |
| ii. ....................................................... | ................................ |
| iii.. ...................................................... | ................................ |
| iv.. ...................................................... . | ............................... |

9. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————

10. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේද?:——————————————

11. එසේ නම් දඬුවමේ ස්වභාවය:——————————————

12. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර:——————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් ඉදිරිපත් කර ඇති යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————